ශීර්ෂය 334 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව

-------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

-------

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි

ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**-----------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත්වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------------- | ----------- |
| 2021 වර්ෂය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 25,959,720,000 කින් රු. 9,557,479,050 ක් උපයෝජනය කර තිබුණු අතර ඉතිරිය රු. 16,402,240,950 ක් හෙවත් සියයට 63 ක් විය. වැය විෂයයන් 08 ක ඉතිරිවීම් එකතුව රු. 15,385,192,167 ක් වූ අතර එම ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 80 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | බහුකාර්ය සංවර්ධන නිලධාරින් 100,000 ක් ස්ථිර කොට වැටුප් ගෙවීම, නිල ඇඳුම් ලබා දීම, පුහුණු කිරීම වැනි කටයුතු සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වීම මත ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකි විය. | වාර්ෂික ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කළ යුතුය. |

**2. අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------------- | ----------- |
| රජයේ නිලධාරින්ට අත්තිකාරම් “බී” ගිණුමේ අනුමත උපරිම හර ශේෂ සීමාව රු.19,768,427 කින් ඉක්මවා තිබුණි. මෙම සීමා ඉක්මවීම සම්බන්ධයෙන් අනුමත සීමා සංශෝධනයට නිර්දේශ ඉදිරිපත් කරන බව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් දැනුම්දී තිබුණද 2022 මැයි මාසය වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තුවෙන් විමසන ලද අතර 2022/05/31 දිනට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දැනුම් දෙන ලදී. | අනුමත උපරිම හර සීමාව තුළ කටයුතුකළ යුතුවීම |

**3.	මෙහෙයුම් සමාලෝචනය**

**3.1	අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ඔක්තෝබර් මස බඳවාගත් පුහුණුලාභීන් 34,605 අතරින් 2022 වර්ෂය වන විට මාසය 06 ක පුහුණුවෙන් පසු තෙවන අදියරේ පුහුණුව සම්පූර්ණකර ගෙවීම් කොන්දේසි සපුරා තිබුනේ 22,306 ක් පමණක් වූ අතර පුහුණුව සාර්ථකව නිමකල පුහුණුලාභීන්ට NVQ 3 සහතිකය පිරිනැමීම 2022 මැයි මාසය වන විටත් ඉටු වී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පුහුණු ලාභින් පුහුණු කිරීම, NVQ 3 සහතිකය ලබා දීම හා ස්ථිර කිරීමට අදාල කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

**3.2	වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව දෙසැම්බර් 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් එම මණ්ඩලය පත් කර තිබුණේ 2022 මාර්තු 15 දිනදී වූ බැවින් 2022 අප්‍රේල් 30 වන විටත් භාණ්ඩ සමීක්ෂණය අවසන්ව නොතිබුණි. | 2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කොට ඇති අතර වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම. |

**3.3 අනාර්ථික ගනුදෙනු**

---------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැකියා ලාභීන්ට පුහුණුවෙන් පසු NVQ 3 සහතිකය ලබාදී සුදුසු රජයේ රැකියා සඳහා අනුයුක්ත කිරීමට අපේක්ෂා කළද, පුහුණු කාලය තුලදී ඉවත්වූ පුහුණුලාභීන් සංඛ්‍යාව 2,470 ක් විය. මෙම පුහුණුලාභීන් සඳහා මාසිකව ගෙවන ලද රු.22,500 බැගින් වූ වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. මෙම ඉවත් වූ පුහුණුලාභීන් 2,470 සඳහා මාසයක දීමනාව පමණක් රු. මිලියන 55.58 ක් විය. | ඉවත්වූ සංඛ්‍යාව 7% ක පමණ ප්‍රමාණයකි. විවිධ හේතු මත පුහුණු ලාභීන් ඉවත්වීම ආරම්භක අවස්ථාවේ සිට විවිධ අදියර යන්හිදී සිදුව ඇත. න්‍යායාත්මක පුහුණුවෙන් පසු පුහුණුලාභීන් විවිධ ආයතන වල ප්‍රාථමික ශ්‍රේණියේ රැකියාවලට යොමු කර ඇති බැවින් ඔවුන්ට ගෙවන ලද දීමනාව නිශ්කාර්ය වියදමක් සේ සැලකිය නොහැක. | පුහුණුලාභින් හැරයාම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බැවින් හැරයාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම |

**4. මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා සියළු මට්ටම්වල පුරප්පාඩු ප්‍රතිශතය සියයට 25 සිට සියයට 100 දක්වා පැවතීම, දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |
| (ආ) පරිපාලන නිලධාරී තනතුරු දෙක සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 20 න් තනතුරු 15 ක් හා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 30 න් 23 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තු දෛනික රාජකාරිවලට බාධාවක් බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාවර කටයුතු කිරීම. |